# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.10.15

වර්ෂ 2021 ක් වූ ඔක්තෝම්බර් මස 15 වන සිකුරාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ඔක්තෝම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
13. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
14. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
15. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
16. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
17. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
18. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-</u>**

**<u>01. 2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට යෝජනා කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සහ ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් තමා පසුගිය මහා සභා රැස්වීමේදී කරනු ලැබූ ප්‍රකාශ මෙම මහා සභා රැස්වීම් වාර්තාවේ අන්තර්ගත නොවන නිසා මෙම මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත නොහැකි බැවින් පිළිගත හැකි මහා සභා රැස්වීම් වාර්තාවක් සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි මෙම මහා සභා රැස්වීම් වාර්තා සකස්කර ඇති බවත්, ඉදිරිපත්කර ඇති මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් මෙම මහා සභා රැස්වීම් වාර්තාව නීත්‍යානුකූල නොවන නිසා එය සභා සම්මත කිරීම සඳහා බෙදීමකට යාමට සිදුවන බැවින් අද දින මහා සභා රැස්වීම අඩාලව කල් තබා විමර්ශන නිලධාරීව කැඳවා හෙට දිනයේදී මහා සභා රැස්වීම පවත්වන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සඳහා බෙදීමකට යා නොහැකි බවත්, මහා සභා රැස්වීම් වාර්තාව නීත්‍යානුකූල නොමැති නම් ඒ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලෙස සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් පසුගිය මහා සභා රැස්වීමේදී තමා විසින් ප්‍රකාශ කරන ලද කරුණු මහා සභා රැස්වීම් වාර්තාවේ සඳහන් නොවීම පිළිබඳව අදහස් දක්වන ලදී.

2021.08.18 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සඳහා යෝජනා කිරීමෙන් පසු එම යෝජනාව ස්ථිර කර ඇති බැවින්, මෙම මහා සභා රැස්වීම් වාර්තාව සඳහා සංශෝධන හෝ විරෝධතා තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

**2021.08.18 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව සිය විරෝධතාවය ප්‍රකාශ කරන ලද ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
05. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
07. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
10. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
11. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් මෙම මහා සභා රැස්වීම් වාර්තා ගරු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය හා අනන්‍යතාවය රැකෙන පරිදි සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ඉදිරිපත් කරනවා නම් තමන්ගේ විරෝධතාවයක් නොමැති බවත්, නමුත් ගරු මන්ත්‍රීවරු පසුගිය මහා සභා රැස්වීම්වලදී ප්‍රකාශ කරන ලද අදහස් මෙම මහා සභා රැස්වීම් වාර්තාවේ නොමැති බැවින් මෙම මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත නොහැකි බවට ප්‍රකාශ කරන ලදී.

මෙය හිතාමතා කරන ලද දෙයක් නොවන බවටත්, මෙම මහා සභා රැස්වීම් වාර්තාව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අප ප්‍රාදේශීය සභාවේ කටයුතු විමර්ශනය සඳහා පත්කොට ඇති විමර්ශන නිලධාරිගේ අධීක්ෂණය යටතේ සකස්කර ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් මෙම මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කළ අකාරය නිසා මෙම මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සිදු කළ නොහැකි බවටත්, සභාවේ බහුතරය මෙම මහා සභා රැස්වීම් වාර්තාව සඳහා සිය විරෝධතාවය ප්‍රකාශ කළ බැවින් මෙය සභා සම්මත නොවන බවටත් ප්‍රකාශ කරන ලදී.

2021.08.18 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සඳහා ගරු සභිකවරු දක්වන ලද විරෝධතාවය සඳහන් කරන බවටත්, 2021.08.18 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් නැවතත් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් මෙම ගැටළුව පිළිබඳව ලේකම්තුමාට සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා විසින් විමර්ශන නිලධාරිගේ උපදෙස් පරිදි මෙම මහා සභා රැස්වීම් වාර්තා නිවැරදිව සකස් කර ඇති බවටත්, මහා සභා රැස්වීම් වාර්තා සඳහා ගරු සභිකවරුන්ගේ විරෝධතා පවතී නම් ඒවා සඳහන් කිරීම ප්‍රමාණවත් බවටත්, මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සඳහා බෙදීමකට යාමේ අවශ්‍යතාවයක් නොමැති බවටත් සභාව දැනුවත් කරන ලදී.

කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් මහා සභා රැස්වීම් වාර්තාව සඳහා පක්ෂ සභිකවරුන්ගේ නම්ද, වාර්තාවේ සඳහන් කරන ලෙසට කරන ලද ඉල්ලීම ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් මෙම මහා සභා රැස්වීම අඩාලව කල් තබා විමර්ශන නිලධාරියෙකු සමග හෙට දිනයේදී නැවත මහා සභා රැස්වීම කැඳවන ලෙසට කරන ලද ඉල්ලීම ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම සඳහා පක්ෂ ගරු සභිකවරුන්ගේ නම් සඳහන් කිරීමේ යෝජනාව පිළිබඳව තමන්ගේ එකඟතාවයක් නොමැති බවටත්, මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා ඇති විරෝධතාවයන් පිළිගත හැකි බවටත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සභා සම්මත කිරීම සඳහා බෙදීමකට යා නොහැකි බවටත්, මහා සභා රැස්වීම් වාර්තාව සඳහා විරෝධතා පමණක් සටහන් කර ගැනීම සිදු කළ හැකි බවටත් ප්‍රකාශ කරන ලදී.

2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා සංශෝධන ඉදිරිපත් නොවූ අතර, 2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත විය.

**<u>02. 2021-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

2021-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට යෝජනා කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2021-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>2021.09.15 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව සිය විරෝධතාවය ප්‍රකාශ කරන ලද ගරු සභිකවරු</u>**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
05. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
07. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
10. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
11. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

2021-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සඳහා සංශෝධන ඉදිරිපත් නොවූ අතර, 2021-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අද දිනයේ පවත්වනු ලබන මහා සභා රැස්වීම නීත්‍යානුකූල නොවන බවත්, අද දිනයේ මහා සභා රැස්වීමේදී ගනු ලබන සභා තීරණ නීත්‍යානුකූල නොවන බවත්, එබැවින් අද දිනයේ පැවැත්වෙන මහා සභා රැස්වීම සඳහා විරෝධය පළ කරමින් තමන් ඇතුළු පිරිස සභා ගර්භයෙන් පිටව යන බවට ප්‍රකාශ කරන ලදී.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩබ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය, ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සහ ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

සැප්තැම්බර් මස 29 වන දින කලේගාන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ බවටත්, රුපියල් කෝටි විස්සකට ආසන්න මුදලක් වැය කරමින් සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ද මෙම වර්ෂයේදීම ආරම්භ කරන බවටත් සභාව දැනුවත් කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ඉතිහාසයේ සෞභාග්‍යමත් යුගය මේ වන විට එළඹී ඇති බැවින්, ඒ සඳහා කුහකකමකින් තොරව, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබා දෙන ලෙස සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**

**01.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන කාර්යාලයට අයත් ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද වරිපනම් පනවා ඇති ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහා වාර්ෂික වටිනාකම 2016 වර්ෂයේදී බලපැවැත්වූ තක්සේරුව 2022 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, පෝද්දල උප කාර්යාලයීය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය තුළ පිහිටා ඇති වරිපනම් බදු පනවා ඇති ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහාම වරිපනම් බදු අයකිරීම සඳහා වන වාර්ෂික වටිනාකම ලෙස 2017 වර්ෂයේ නියම කරන ලද තක්සේරුව පිළිගැනීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහතින් විස්තර කරන ලද වරිපනම් ප්‍රදේශය තුළ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකමින් 7% බැගින් වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථොක්ත වාර්ෂික වරිපනම් බද්ද 2022 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන් වලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවටද, එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල් වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් එම වර්ෂයේ වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද දෙනු ලැබෙන අතර එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලබන විට කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2013.05.17 වැනි දින අංක 1811 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වන දින අංක 1878 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද, 2015.04.21 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන 2015.09.11 වන දින සිට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා

නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ 1 වැනි තීරුව දක්වෙන ව්‍යාපාරය/කර්මාන්තය සම්බන්ධයෙන් වන විට දී එයට ඉදිරියෙන් II තීරුව දක්වෙන එකී ව්‍යාපාරය කර්මාන්තය/ කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ හෝ පරිශ්‍රයේ වාර්ෂික වටිනාකමට අදාළව දක්වෙන බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය / ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා වූ හෝටලයක් /ආපනශාලාවක්/ නවාතැන්පළක් වන අවස්ථාවක ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ කුමක් සඳහන් වුව ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වන ගාස්තුව ඒ හෝටලය හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පළේ 2021 වර්ෂය තුළ ලැබූ ආදායමින් 1% ක් විය යුතු බව යෝජනා කරමි.

**උප ලේඛනය**

| **I තීරුව** | | **II තීරුව** | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය** | **වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව**<br>රු. ශත | **වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව**<br>රු. ශත | **වාර්ෂික වටිනාකම රු.1500.00 ඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව**<br>රු. ශත |
| 01 | මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | සිසිල් බීම කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කිරිපට්ටි | 500.00 | 750.00 | 1000.00 |
| 07 | පිහිණුම් තටාක | 500.00 | 750.00 | 1000.00 |
| 08 | අයිස් කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 09 | බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ | 500.00 | 750.00 | 1000.00 |
| 10 | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 11 | නවාතැන් පොළවල් / ලැගුම්හලක් (Resturant) | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 14 | සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 16 | කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | සිමෙන්ති බ්ලොක්ගල්, මල් පෝච්චි , බීරළු නිපදවීම හෝ විකිණීම ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | යෝගට් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | උත්සව අවස්ථාවනට ආහාර සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | ශීතකල මස් හෝ මාලු විකිණීම, ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | ඌරු කොටුවක් පවත්වාගෙන යාම / එළුවන් ඇතිකිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22 | මස් පිණිස, බිත්තර පිණිස, කුකුළන් කිකිළියන් ඇති කිරීම (කුකුළු කොටුවක් පවත්වාගෙන යාම) | 500.00 | 750.00 | 1000.00 |
| 23 | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | කාමර පහසුකම් ලබා දිම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | ක්ෂණික ආහාර විකිණීම හා නිපදවීම (පේස්ට්‍රි ෂොප්) හා ස්නැක් බාර් හෝ කිරි හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | ආහාර වශයෙන් අනු භවය සඳහා බීජ වර්ග (අංකුර සහිත මුං ඇට) පැකට් කර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | අයිස්ක්‍රීම්, බටර්, යෝගට් අලෙවිසැලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | සකස් කරන ලද ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 29 | සංචාරක සත්කාරක නිවහනක් හෝ ආගන්තුක නිවාසයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 30 | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 31 | ජෑම්, සෝස්, සිරප්, පුඩිං, ජෙලි නිපදවීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 32 | විනාකිරි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33 | රස කැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 34 | මිරිස්, ධාන්‍ය වර්ග, පිටි, මාංශ, බෙහෙත් ද්‍රව්‍ය කෙටීමේ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 35 | පානීය ජලය බෝතල් කර ගබඩා කිරීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 36 | පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37 | කරවල, ජාඩි වේලීම හෝ ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 38 | තේ කුඩු විකිණීම හා පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39 | සෞඛ්‍ය ආරක්ෂිත දියර වර්ග, මුහුණු ආවරණ නිෂ්පාදන ගබඩා කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 40 | වාහන / යතුරු පැදි ටින්කරින් කිරීම ස්ප්‍රේ පේන්ටින් වැඩ කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප වන තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු:750/-ට වැඩි නොවන රු. ශත | වාර්ෂික වටිනාකම රු:750/- සිට 1500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු:1500 ට වැඩි ස්ථාන රු. ශත |
| 1. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | වෙල්ඩින් වැඩපළක් හෝ ඩ්‍රිල් වැඩ පළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය , පුළුන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, පරිගණක යන්ත්‍ර, සෙලියුලර්, අධිශීතකරණ, දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | මෝටර් කොයිල් එතීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | පොහොර වර්ග, කෘෂි රාසායනික ද්‍රව්‍ය , පොහොර නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | ගල්වලක් හා් අතින් ගල් කඩන ස්ථානයක් පැවැත්වීම (කබොක්, බොරළු, හෝ කළු ගල් ) | 500.00 | 750.00 | 1000.00 |
| 9. | බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | වී පාහින මෝලක් පවත්වාගෙන යාම/ධාන්‍ය ඇඹරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර, කැමරා විඩියෝ, ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම, යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම, ලෑලි සකස් කිරීම, පදම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | පොල් පරාල හා යට ලී ඉරන, ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | දර මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන වඩු මඩුවක් පවත්වාගෙන යාම/වඩුකර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | මැටි බඳුන් නිපදවීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (විසිතුරු මැටි බදුන් /කෝප්ප) | 500.00 | 750.00 | 1000.00 |
| 21. | කම්මලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22. | වැලි ගොඩදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | ත්‍රීරෝද රථ මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | පාපැදි අළුත්වැඩියා කිරීමේ (වින්කලයක්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 26. | විදුලි භාණ්ඩ ශීතකරණ හෝ මහන මැෂින් හා අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිපදවීමේ, අලි කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | සම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 750.00 | 750.00 | 1000.00 |
| 29. | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 30. | වාහන ෂීට් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 31. | කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 32. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33. | වානේ ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හා ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 35. | බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | බලවේග රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37. | සබන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 38. | විදුලි කාර්මික වැඩ පළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39. | ඉදල්, කොහු, පාපිසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 40. | ගොඩනැගිලි ඉදිකිරීමේ උපකරණ බදු දීමේ (පලංචි ආදිය) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | පැන්ට්‍රි කබඩ් නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 42. | මැණික් ගල් කැපීමේ හා ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43. | කොප්පරා නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44. | බහුකාර්ය වඩු කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 45. | සයිලන්සර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 46. | ලෝහමය සුන්බුන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 47. | උළු හෝ ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 48. | යන්ත්‍ර මගින් කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 49. | ලී බීරළු කැපීම | 500.00 | 750.00 | 1000.00 |
| 50. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති ගඩොල්/කැටගල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 51. | ගල් මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 52. | කොහු හා කොහු ලණුවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 53. | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි තැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 54. | මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 55. | බුරුසු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56. | පොල් කටු අඟුරු පිලිස්සීමේ විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 57. | මෝටර් වාහන සඳහා බොඩි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 58. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 59. | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 60. | ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 61. | ප්‍රචාරක දැන්වීම් පුවරු ඇඳීම / ප්ලාස්ටික් අංක තහඩු සෑදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 62. | බෑග් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 63. | අත පිසදමන කඩදාසි (සර්වියට් පේපර්ස්)/ බත් ඔතන කොළ (ලන්ච් ශීට්) කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 64. | බැටරි චාර්ජ් කිරීම/ අළුත්වැඩියා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 65. | ෆයිබර් ග්ලාස්/ ප්ලාස්ටික් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 66. | කොහු මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 67. | පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 68. | හුණු වැරටි පිළිස්සීම සඳහා පෝරණුවක් පවත්වාගෙන යාම ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 69. | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 70. | හම් වර්ග වලින් හෝ රබර් වර්ග වලින් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පැවතීම | 500.00 | 750.00 | 1000.00 |
| 71. | රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 72. | රබර් දුම් ගෙයක් පවත්වාගෙන යාම, රබර් ෂීට් නිපදවීම, රෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 73. | ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීම හෝ විකිණීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 74. | වාහන ගෑස් කිරීම හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 75. | ගෑස් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 76. | රෙදි පින්තාරු, මුද්‍රණය, සායම් දමන ස්ථානයක් (බතික් වැඩපළක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 77. | ස්වර්ණාභරණ නිපදවීම අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 78. | ස්වර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 79. | මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 80. | සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 81. | ලෝහ භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 82. | පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 83. | ටයර්, ටියුබ් වොල්කනයිසිං කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 84. | අලුත් හෝ පරණ ටයර්, ටියුබ් ගබඩා කිරීම, කට්ටා කැපීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 85. | කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 86. | පොල් තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 87. | බැටරියෙන් ක්‍රියා කරන මෝටර් රථවල බැටරි ආරෝපනය කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 88. | ස්වර්ණාභරණ (රන් හා රිදී) නිපදවීම අලුත්වැඩියාව / පාට කිරීම /අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ හෝ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ පහත උපලේඛනයේ පළවන කොටසේ දක්වෙන යම් ව්‍යාපාරයක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වා ගෙන යන සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබූ ආදායම උපලේඛනයේ දෙවන කොටසේ පළමු තීරයේ දැක්වෙන පරාසය තුල පිහිටන විට එහි දෙවන තීරුවේ දැක්වෙන එයට අනුරූපිතව ඇති බදු මුදල 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් 30 වන දිනට පෙර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

## උප ලේඛන

පළමු කොටස

1. කොමිස් ඒජන්තවරුන්
2. බ්‍රෝකර්වරු
3. වෙන්දේසිකරුවන්
4. නීතිඥයින්
5. උකස් බඩු ගන්නන්
6. ගණන් පරීක්ෂවරුන්
7. කොන්ත්‍රාත්කරුවන්
8. රියදුරු පුහුණු ආයතන
9. ප්‍රවාහන නියෝජිතයන්
10. විදේශීය රැකියා ඒජන්සි පවත්වන්නවුන්
11. නොතාරිස්වරුන්
12. මූල්‍ය ආයතන හා බැංකු
13. මුදල් සපයන්නන් හෝ මුදල් ණයට දෙන්නන්
14. ගෘහ නිර්මාණ ශිල්පින්
15. රක්ෂණ නියෝජිතයන්
16. බැංකු පවත්වා ගෙන යාම (වාණිජ බැංකු හා ග්‍රාමීය බැංකු)
17. ස්වර්ණාභරණ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
18. සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
19. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
20. සාත්තු නිවාසයක්, විශේෂඥ වෛද්‍ය සේවා ස්ථානයක්, ශල්‍යාගාරයක් (පෞද්ගලික රෝහලක්) පවත්වා ගෙන යාම.
21. (රටබිම) මත්පැන් විකිණීම වයින් ස්ටෝර්ස් එකක් පවත්වාගෙන යාම
22. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
23. අපනයනය සඳහා ඇඳුම් නිපදවීම
24. රේස් තුණ්ඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. පාවිච්චි කළ හා /හෝ අලුත් මෝටර් රථ ගෙන්වීම හා /හෝ අමතර කොටස් වෙළඳාම් කිරීම, ප්‍රදර්ශනය කිරීම
26. ස්පයිස් තෙල් වර්ග, පින්තූර කාඩ් වර්ග, කුළුබඩු වර්ග විකිණීම හා වැවීම (සංචාරකයින් සඳහා)
27. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
28. ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම (පෞද්ගලික)
29. සුදු යකඩ හා දැව වලින් භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම හෝ විකිණීම
30. ලී මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වාගෙන යාම
31. ජාත්‍යන්තර පාසලක් පවත්වා ගෙන යාම
32. සුපිරි වෙළඳසැලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන යාම
33. ත්‍රීරෝද රථ, යතුරු පැදි, මෝටර් වාහන විකිණීම
34. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
35. ට්‍රැවල් ඒජන්සියක් පවත්වාගෙන යාම
36. බැකෝ, ලෝඩර් යන්ත්‍ර , බැකෝ යන්ත්‍ර , ඩෝසර් හා මෝටර්ගේඩර් යන්ත්‍ර මාර්ග තලන හා පස් තලන යන්ත්‍ර , ට්‍රැක්ටර් හා ටිපර් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර, කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පොලිතින් බෑග් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම ව්‍යාපාරයක් පැවැත්වීම
38. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
39. වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
40. රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
41. සැපයුම්කරුවන්
42. දේපළ වෙළඳාම් කිරීමේ සමාගමක් පවත්වාගෙන යාම

43. වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
44. ලොතරැයි නියෝජිතයින්
45. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වාගෙන යාම
46. පෞද්ගලික පෙර පාසල් පැවැත්වීම
47. රැකියා ඒජන්තවරු
48. උත්සව පැවැත්වීම සඳහා ශාලාවක් පවත්වාගෙන යාම
49. උත්සව භාණ්ඩ කුලියට දීම
50. සිවිල් ඉංජිනේරු සම්බන්ධ උපදේශක සේවා සැපයීම
51. පෞද්ගලික හෙද විද්‍යාලයක් පවත්වාගෙන යාම
52. පොල් එකතු කිරීමේ හෝ තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. සාප්පු බඩු, මනි බඩු , සුවඳ විලවුන් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. පාපැදි, මෝටර් සයිකල් හෝ ත්‍රී රෝද රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
58. බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළෙඳාම)
59. ඉංග්‍රීසි බෙහෙත් බඩු විකුණන (ෆාමසි) ස්ථානයක් පවත්වාගෙන යාම.
60. සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉංග්‍රීසි හෝ සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
62. දන්ත චිකිත්සාගාරයක් දත් බඳින ස්ථානයක්, ශල්‍යාගාරයක් එක්ස්රේ යන්ත්‍රයක් පවත්වාගෙන යාම
63. විකිණීම සඳහා බිම් මල් හෝ වෙනත් මල්, එළවළු, පළතුරු, පැල වර්ග බෙහෙත් පැලැටි තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම
64. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ජ්‍යොතිෂ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. මෙඩි ලැබ් එකක් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ස්ථානයක් පවත්වාගෙන යාම
67. උළු, ගඩොල්, වැලි, ගල් සැපයීම හා විකිණීම
68. මනාලියන් හැඩ ගැන්වීම, කොණ්ඩා මෝස්තර දැමීම (බියුටි සැලුන්) උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. රෙදි පිළි විකිණීමේ ස්ථානයක් (රෙදි කඩයක්) පවත්වාගෙන යාම
70. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (තනි මැෂිමක)
72. ඇස් කණ්ණාඩි (ඔප්ටිකල්ස්) නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. ඡායාරූප ශාලාවක් (ස්ටුඩියෝ) පවත්වාගෙන යාම
74. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
75. සී.ඩී, වී.සී.ඩී. විඩියෝ කැසට් ගීත පටිගත කිරීම හෝ විකිණීම, කුලියට දීම, පවත්වාගෙන යාම, සංයුක්ත තැටි කුලියට දීම හා විකිණීම
76. ලිපිද්‍රව්‍ය , පුවත්පත් , සඟරා, පාසැල් උකරණ (බුක්ෂොප්) පවත්වාගෙන යාම ගබඩා කිරීම හා විකිණීම.
77. දේශීය හා විදේශීය දුරකථන ඇමතුම් ලබාදීමේ ස්ථානයක් (කොමියුනිකේෂන්) පවත්වාගෙන යාම
78. ක්ෂණික ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීම, යතුරු ලියනය කර දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. පරිගණක යන්ත්‍ර විකිණීමේ, අලුත්වැඩියා කිරීමේ, පුහුණු පාඨමාලා පැවැත්වීම, සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. විදේශ චෙක්පත් (මුදල්) මාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
81. ගොඩනැගිලි ද්‍රව්‍ය (හාඩ්වෙයාර්) විකිණීමේ/ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. අටපිරිකර, පූජා භාණ්ඩ ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. සංගීත භාණ්ඩ කුලියට දීම හා නිපදවීම හෝ විකිණීම ස්ථානයක් පවත්වාගෙන යාම

84. මදුරු දැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
85. පුවත්පත් දැන්වීම් පළකිරීමේ ඒජන්සියක් හෝ පුවත්පත් විකිණීම සඳහා ඒජන්සියක් පවත්වාගෙන යාම
86. බෝට්ටු ඔරු (තොටුපොළක්) සේවාවන් පවත්වාගෙන යාම
87. ජුකී මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. සෙලියුලර් දුරකථන හා දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. පෞද්ගලික පාසලක් පවත්වාගෙන යාම
90. පරණ යකඩ බඩු, ප්ලාස්ටික් භාණ්ඩ, හිස් බෝතල්, පත්තර, ගෝනි ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. පිඟන් භාණ්ඩ (පෝසිලේන්, සිල්වර් භාණ්ඩ ඇතුළු) ගබඩාකර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මෝටර් රථ අමතර කොටස් විකිණීම
93. සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම හා මාලු ටැංකි සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. රේස් මුදල් ඔට්ටු එකතු කිරීමේ ස්ථානයක් (බුකී හා රේස් බයි ) පවත්වාගෙන යාම
95. ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
96. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් (කුටියක්) පවත්වාගෙන යාම
97. දැන්වීම් පුවරු ඇඳීම, ප්ලාස්ටික් අංක තහඩු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/ ස්ටිකර් කැපීම/ අකුරු ඇලවීම
98. ලී බඩු හෝ වෙනත් ඕනෑම ජංගම අලෙවිපළක් (salecenter) පවත්වාගෙන යාම (දිනකට)
99. ස්ථාවර හා ජංගම දුරකථන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාම ( දින 01 සිට 07 දක්වා)
100. බැංකු වලින් උකස් කර බේරා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේදී එක් දිනකට අය කිරීම.
101. පශු වෛද්‍ය ගිලන්හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
102. ඇලුමිනියම් භාණ්ඩ විකිණීම ගබඩා කිරීම
103. සත්ව ආහාර ගබඩා කර තැබීම, විකිණීම
104. පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
105. මල් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම කෘතිම / ස්වභාවික
106. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම
107. තේ ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. රබර්/පොලිමර් සීල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. මැටි භාණ්ඩ හෝ මල් පෝච්චි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. වීදුරු කපන ස්ථානයක් හෝ අලෙවිසැළක් පවත්වාගෙන යාම
111. ගඩොල් හෝ උළු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
113. පාවිච්චි කරන ලද ඇඳුම් විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. තේ දළු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115. ඒජන්සි තැපැල්හලක් පවත්වාගෙන යාම
116. ඇස්බැස්ටෝස් ගබඩා කර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
117. හිරු එළියෙන් ක්‍රියාකරන (සෝලා පවර්) උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. ඇඟලුම් සඳහා ලේබල් නිෂ්පාදනය කිරීම
119. ආහාර ද්‍රව්‍ය තොග, සිල්ලරට විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
120. තොග වශයෙන් විකිණීම සඳහා පිටි , ලුණු හොණ්ඩර 15 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121. ආරෝග්‍ය ශාලාවේ සිටින ලෙඩුන් සඳහා උපස්ථායක සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122. කැලි රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
123. සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
124. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
125. සිසිල් බීම එජන්සියක් පවත්වාගෙන යාම
126. සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

127. අන්තර්ජාල සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
128. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
129. කෘෂි රසායන ද්‍රව්‍ය/ පොහොර විකිණීම
130. ත්‍රී රෝද රථ/ මෝටර් සයිකල් අළුත්වැඩියාව
131. මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
132. කූල් ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් පවත්වාගෙන යාම
133. කුළු බඩු/ ධාන්‍ය තොග විකිණීමේ/ ආහාර පනතට ගැනෙන ඕනෑම ද්‍රව්‍යයක් නිපදවීම, ගබඩා කිරීම , ඇහිරීම, බෙදා හැරීම හා සිල්ලරට විකිණීම
134. එළවළු හා පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
135. පුද්ගලික රථ ගාලක් පවත්වාගෙන යාම
136. බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ (සාමාන්‍ය වෙළඳාම)
137. බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
138. කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පැවැත්වීම හෝ කුරුඳු දර විකුණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
139. කුරියර් සේවාවක් පවත්වා ගෙන යාම (පෞද්ගලික තැපැල් භාණ්ඩ බෙදා හැරීමේ ස්ථානයක්)
140. අන්තර්ජාලය හරහා භාණ්ඩ හා සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
141. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම
142. කල්බදු සේවා සැපයීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
143. කර්ටන් මැසීම හෝ මසා නිමකළ කර්ටන් (තිර රෙදි) විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
144. සංචාරකයින් සඳහා මඟ පෙන්වීමේ ආයතනයක් (ගයිඩින් සේවාව) පවත්වා ගෙන යාම
145. චැනල් සේවා ස්ථානයක් පවත්වා ගෙන යාම (වෛද්‍යවරුන් හමු වීම)
146. තීන්ත වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
147. ඒජන්සියක් පවත්වා ගෙන යාම (රසායනික ද්‍රව්‍ය, බෙහෙත්, සබන් වර්ග හා සුවඳ විලවුන්)
148. ක්‍රීඩා පුහුණු කිරීමේ ස්ථානයක් (පෞද්ගලික) පවත්වා ගෙන යාම
149. විදේශ රටවලින් ගෙන්වන ලද ඇඳුම් විකිණීම හා බෙදාහැරීම
150. විදේශ රටවලින් ගෙන්වන ලද පාවහන් හා සෙරෙප්පු තොග / සිල්ලර වශයෙන් අලෙවි කිරීම
151. ඩිටර්ජන්ට් කුඩු හා දියර වර්ග නිපදවීම
152. කුරුඳු, තේ, රබර් යන සුළු අපනයන බෝග අපනයනය කිරීම.
153. ඖෂධ වර්ග ගබඩා කර බෙදාහැරීමේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම. (ඉංග්‍රීසි බෙහෙත් විකුණන ස්ථානයක්)
154. ඇඟ වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
155. කේබල්, T.V. සේවා සැපයීමේ කාර්යාලයක් පවත්වා ගෙන යාම.

**දෙවන කොටස**

| | පළමු තීරුව<br>වර්ෂය සඳහා ව්‍යාපාරයේ ආදායම | දෙවන තීරුව<br>නියමිත බදු මුදල<br>රු.ශත |
|---|---|---|
| 1. | රුː 6000/- නොඉක්මවන අවස්ථාව | නැත |
| 2. | රුː 6000/- ඉක්මවන එහෙත් රුː 12000/- නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3. | රුː 12000/- ඉක්මවන එහෙත් රුː 18750/- නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| 4. | රුː 18750/- ඉක්මවන එහෙත් රුː 75000/- නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| 5. | රුː 75000/-ඉක්මවන එහෙත් රුː 150000/- නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| 6. | රුː 150000/- ඉක්මවන අවස්ථාවක | 3000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සහ ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**05.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 148 (1) වැනි වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2022 වර්ෂය සඳහා නියම කිරීමටත් යෝජනා කරමි.

**උප ලේඛනය**

| | රු:ශත |
|---|---|
| 1. බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන වාහනයක් සඳහා | 25.00 |
| 2. පාපැදිය වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18.00 |
| 3. පාපැදිය වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4.00 |
| 4. සෑම කරත්තයක් සඳහා | 20.00 |
| 5. සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| 6. සෑම ජින්රික්ෂෝවක් සඳහා | 7.50 |
| 7. සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| 8. සෑම ඇතෙකු සඳහා | 50.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** (176 වැනි අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයට පහත සඳහන් පරිදි අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

1. චිත්‍රපට දර්ශන, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සඳහා

| | රු: ශත |
|---|---|
| එක් දිනකට බලපත්‍ර ගාස්තුව | 1000.00 |
| වැඩි වන සෑම දිනකටම | 200.00 |
| 2. සංගීත සංදර්ශන සඳහා එක් දිනකට | 2000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ IV (ආ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා 2022.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

| | | රු: ශත |
|---|---|---|
| 1. | බිත්තියක හෝ ස්ථිර පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි 01 කට | 100.00 |
| 2. | බැනර් හෝ කටවුට් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මාසයක් සඳහා වර්ග අඩියකට | 50.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** මෙහි පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2022 වසර සඳහා පනවා 2022.01.01 සිට අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 01. | අනතුරුදායක ගස් පිළිබඳ දැනුම් දීමේ අයදුම්පත්‍ර ගාස්තු වැඩිවන සෑම එක් ගසක් සඳහා රු. 100.00 බැගින් අය කෙරේ. | 500.00 |
| 02. | වරිපනම් සහතික ගාස්තු (වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු) | |
| | වරිපනම් සහිත | 500.00 |
| | වරිපනම් රහිත | 750.00 |
| 03. | වීථි රේඛා සහතික නැවත නිකුත් කිරීම | 200.00 |
| 04. | ඒ.ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම) ගාස්තු | 500.00 |
| 05. | සංශෝධිත නම සහ අංකය වරිපනම් ලේඛනයේ ලියාපදිංචි කිරීමේ ගාස්තු (එක් නමක් සඳහා) | 300.00 |
| 06. | වරිපනම් ලේඛනයේ උධෘත පිටපත් නිකුත් කිරීම (එක් වර්ෂයකට) | 100.00 |
| 07. | කේ. පෝරම නැවත නිකුත් කිරීම | 100.00 |
| 08. | සහතික පිටපත් ගාස්තු (එක් වර්ෂයකට සෙවීමේ ගාස්තුව) | 100.00 |
| 09. | ජල සහතික ගාස්තු/ විදුලි / වෙනත් | 300.00 |
| 10. | රැස්වීම් ශාලාව බදු දීම (එක් දිනකට) | 2000.00 |
| 11. | ජල නල එළීම සඳහා පාරවල් පළුදු කිරීමේ ගාස්තු | |
| | I. එක් පැත්තක 1(m) × 1(m) වළක් තැනීමේදී පමණක් | 1500.00 |
| | II. අවම 3(m) ක නලය එළිමේදී 0.3 (m)×3(m) | |
| | මාර්ග පළුදු කිරීම සඳහා (තාර සඳහා) | 1500.00 |
| | මාර්ග පළුදු කිරීම (කොන්ක්‍රීට් සහ කුට්ටි ගල් සඳහා) | 2200.00 |
| | මාර්ග පළුදු කිරීම (පස් සඳහා) | 1350.00 |
| | මාර්ග පළුදු කිරීම (කාපට් සඳහා) | 4500.00 |
| | III. වැඩිවන සෑම දික් 1(m) ක් | |
| | අය කිරීම (තාර සඳහා) | 500.00 |
| | අය කිරීම (කොන්ක්‍රීට් සහ කුට්ටි ගල් සඳහා) | 750.00 |
| | අය කිරීම (පස් සඳහා ) | 450.00 |
| | අය කිරීම (කාපට් සඳහා ) | 1500.00 |
| 12. | ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වීමේදී අවසර ලබා දීමේ ගාස්තු දිනකට | 250.00 |
| 13. | පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | 50.00 |
| 14. | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට | 1.00 |
| 15. | පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම | 25.00 |
| 16. | (i) සභාව සතු භූමි වල පවත්නා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයකිරීම (දිනකට) | 2000.00 |
| | (ii) ආපසු ගෙවන ආරක්ෂක ඇප තැන්පත් | 1000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඉඩම් අනුබෙදුම් /ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම**

**09.** නාගරික සංවර්ධන ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් 2009.04.16 වන දින කොළඹදී රජයේ නිවේදන එල්.ඩී.බී.16/78 යටතේ ප්‍රකාශයට පත් කරන ලද අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පස්වන (V වන) උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂයට බලපාන පරිදි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පනවා 2022.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

01. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු

| | |
|---|---|
| නේවාසික | 600.00 |
| වානිජ | 1000.00 |

02. ඉඩම් අනුබෙදුම් අයදුම්පත් ගාස්තු

| | |
|---|---|
| නේවාසික | 500.00 |
| වානිජ | 1000.00 |

අනුමත ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කිරීම (උපරිම කාලය දීර්ඝ කිරීම අවුරුදු 05 කි)

| | |
|---|---|
| පළමුවැනි අවුරුද්ද සඳහා | 200.00 |
| දෙවැනි අවුරුද්ද සඳහා | 250.00 |
| තෙවැනි අවුරුද්ද සඳහා | 300.00 |
| සිවුවැනි අවුරුද්ද සඳහා | 350.00 |
| පස්වැනි අවුරුද්ද සඳහා | 400.00 |

03. ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධ සහතික නිකුත් කිරීමේ ගාස්තු 500.00

04. 1990 ට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි වල සැලසුම්පත් අනුමත කිරීම අනවශ්‍ය බව සනාථ කරන ලිපිය සඳහා ගාස්තුව 1000.00

**වෙනත්**

| | | |
|---|---|---|
| 01. වතුර බවුසරය කුළියට දීම (ජලය රහිතව) | 2750.00 | |
| දිනක් රඳවා ගැනීම වෙනුවෙන් | 500.00 | |
| (දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක.) | | |
| සතියේ වැඩ කරන දවස් 05 තුළ ජලයට අය කරන ගාස්තුව | 500.00 | 8% VAT මුදලක් ද අය කෙරේ. |
| සෙනසුරාදා ඉරිදා ඇතුළු අනෙකුත් නිවාඩු දිනවල ජලයට අය කරන ගාස්තුව | 650.00 | |

<u>**ගාස්තුවෙන් 25% ක් අඩුකිරීම**</u>

I. ජලය බවුසරය ලබාගැනීම ලියාපදිංචි වී ප්‍රතික්ෂේප කළහොත් 25% අඩුකිරීම රු. 687.50/-

II. ජල බවුසරය යාමට ඒමට 20 km කට වඩා වැඩිවුවහොත් 1km ක් සඳහා රු. 55.00 බැගින් අයකරනු ලැබේ

02. ප්ලේට් කම්පන යන්ත්‍රය (රෝලරය) කුලියට දීම

| | |
|---|---|
| පැය 8 ක් | රු. 4025.00 |
| වැඩි වන සෑම කි.මී. 1 සඳහා අයකිරීම | රු. 55.00 |

(දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක.)

03. ඩබල්ඩ්‍රම් කම්පන තලනය කුලියට දීම (පැය 8 ක කාලයකට) රු. 4200.00

04. සමර්හට් 10'×10' එකක් දිනකට කුලීයට දීම රු. 1500.00

05. ක්‍රීඩා භූමි බදු දීමේ ගාස්තු අය කිරිම

මුදල් අයකරන සංදර්ශන සඳහා

| | |
|---|---|
| I. දිනකට | රු. 2000.00 |
| II. ආපසු ගෙවන ඇප තැන්පත් | රු. 1000.00 |

මුදල් අයකරන සංදර්ශන හැර අනෙකුත් සෑම කටයුත්තක් සඳහා

| | | |
|---|---|---|
| I. | දිනකට | රු. 1000.00 |
| II. | ආපසු ගෙවන ඇප තැන්පත් | රු. 1000.00 |

06. ඝාතන ගාස්තු අය කිරීම

තාවකාලික බල පත්‍රයක් මත කරනු ලබන ඝාතනයක් සඳහා අය කරනු ලබන ගාස්තු.

| | | |
|---|---|---|
| I. | ගවයෙකු මැරීම සඳහා | රු. 1000.00 |
| II. | එළුවකු මැරීම සඳහා | රු. 1000.00 |
| III. | ඌරකු මැරීම සඳහා | රු. 1000.00 |

07. කුළුණු සඳහා වාර්ෂික බදු මුදල (දුරකථන කණු) රු. 500.00

**<u>පරිසර අංශය</u>**

| | | |
|---|---|---|
| 01. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත් ගාස්තු | රු. 300.00 |
| 02. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තු | රු. 300.00 |
| 03. | පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | රු. 4000.00 |
| 04. | පරිසර බලපත්‍ර ලබා නොගත යුතු බවට නිකුත් කරනු ලබන ලිපි | රු. 500.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු 267 වන අධිකාරය වූ 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සීමාව ඇතුළත පවත්වනු ලබන එකී ආඥා පනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් සීයට පහළොවක් (15%) බද්දක් පනවා අය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තියේ හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥා පනතේ 03 වැනි වගන්තියේ හා 17 සිට 22 වගන්තිය අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මතු දැක්වෙන උප ලේඛනයේ පළමු කොටසේ සඳහන් සුසාන භූමි වල භූමදාන කිරීමක්, ආදාහනය කිරීම හා තැන්පත් කිරීමක් සඳහාද, ස්මාරකයක් ඉදිකිරීමක් සඳහාද උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් ගාස්තුවක් 2022 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

**පළමු කොටස**

1. හපුගල පොදු සුසාන භූමිය
2. පෝද්දල පොදු සුසාන භූමිය
3. ලබුදූව පොදු සුසාන භූමිය
4. වැලිපිටිමෝදර පොදු සුසාන භූමිය
5. බෝපෙ පොදු සුසාන භූමිය

| **දෙවන කොටස** | | රුඃ ශත |
|---|---|---|
| 1. | වයස් සීමාවකින් තොරව එක් භූමදාන කිරීමක් සඳහා අවසර පත්‍ර ගාස්තු | 500.00 |
| 2. | වයස් සීමාවකින් තොරව එක් ආදාහන කිරීමක් සඳහා ගාස්තු | 2000.00 |

| | | |
|---|---|---|
| 3. | වයස් සීමාවකින් තොරව එක් තැන්පත් කිරීමක් සඳහා (උපරිම බිම් ප්‍රමාණය වර්ග අඩි 18) | 5000.00 |
| 4. | ස්මාරකයක් ඉදිකිරීම සඳහා ගාස්තුව වර්ග අඩියකට (උපරිම වර්ග අඩි 3 1/2 ×2) | 2000.00 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** 126/ඒ කරාපිටිය ග්‍රාම නිලධාරි වසමට අයත් කිරිමැටිමුල්ල වත්ත නැමැති ඉඩම පිඹුරු අංක 2284 යටතේ මැන වෙන් කිරීමේදී පොදු කටයුතු සඳහා පර්චස් 07ක ප්‍රමාණයක් වෙන්කර ඇති බැවින්, මෙම ඉඩම මැනුම් කටයුතු සිදුකර කරාපිටිය ග්‍රාම නිලධාරි වසම සඳහා සේවා පියසක් ඉදිකිරීමට ගැනීමට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් වෙත අනුමැතිය ලබා දීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් මෙම ඉඩමට ඔප්පුවක් නැති බවත්, මිනින්දෝරු සැලැස්මක් පමණක් ඉදිරිපත් කර ඇති බවත්, අසල්වැසියෙකු මේ සඳහා විරෝධතාවය පළ කර ඇති බැවින්, මුළු ඉඩමම මැන අදාළ පර්චස් 07 ක බිම් කොටස වෙන් කර ගැනීම සිදු කර ගැනීම කළ යුතු බවටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙම ඉඩම මැනීමේදී මුළු ඉඩමම මැන පර්චස් 07ක බිම් කොටස වෙන් කර ගැනීම සඳහා එකඟතාවය පළ කරන බවත්, ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්තුමියව දැනුවත් කරන බවටත් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් මෙම ගැටළුව දේශපාලන ගැටුමකට මුල් විය හැකි හේතුවක් වීමට ඉඩ ඇති බැවින්, මුළු ඉඩමම මැන අදාළ පර්චස් 07 ක බිම් කොටස වෙන් කර ගැනීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා 2021 ජුනි මාසයේදී සහ 2021 සැප්තැම්බර් මාසයේදී ඇඳිරි නීතිය ක්‍රියාත්මක වූ කාල සීමාව තුළ ව්‍යාපාරික කටයුතු සිදු නොකිරීම හේතුවෙන් පහත දක්වා ඇති ව්‍යාපාරික ස්ථාන වල බදු මුදල් අය නොකර සිටීමටත්, එම බදු මුදල් පොත් වලින් කපා හැරීමටත් යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපාරික ස්ථානයේ නම | බදු මුදල් අය නොකළ යුතු මාස පිළිබඳ විස්තර | | ප්‍රමාද ගාස්තුව | මුළු මුදල |
|---|---|---|---|---|---|
| | | ජුනි | සැප්තැම්බර් | | |
| 01 | ලබුදූව වෙළඳ සංකීර්ණය | රු.221,625.00 | රු.221,625.00 | රු.44,325.00 | රු.487,575.00 |
| 02 | ගව මස් කඩ (කුරුඳු වත්ත) | රු.86,262.50 | රු.86,262.50 | රු.17,252.50 | රු.189,777.50 |
| 03 | හපුගල ජන සභා ගොඩනැගිල්ල | රු.5,600.00 | රු.5,600.00 | රු.1,120.00 | රු.12,320.00 |
| 04 | ඌරු මස් කඩය (ලබුදූව ගොවිපල) | රු.3,000.00 | රු.3,000.00 | රු.600.00 | රු.6,600.00 |
| 05 | ලබුදූව ජංගම භෝජනාගාර බස් රථය | රු.7,500.00 | රු.7,500.00 | රු.1,500.00 | රු.16,500.00 |
| 06 | වටරැක නැගෙනහිර ප්‍රජා ශාලාව | රු.2,000.00 | රු.2,000.00 | රු.400.00 | රු.4,400.00 |
| 07 | පෝද්දල පොදු වෙළඳ සංකීර්ණය | රු.20,050.00 | රු.20,050.00 | රු.4,010.00 | රු.44,110.00 |
| | | | | මුළු එකතුව | රු.761,282.50 |

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** 2020-10-20 දින පැවති මහා සභා රැස්වීමේ ඉ.12 දරණ තීරණය යටතේ වසර දෙක ඉක්මවූ කර්මාන්ත තැන්පත් යටතේ සභා ආදායමට ලබාගෙන ඇති කුරුඳුවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත සහිරා විද්‍යාලයට සහ ජුම්මා පල්ලියට පිවිසෙන මාර්ගය සංවර්ධනය වෙනුවෙන් ගෙවිය යුතු රු.49,622.84 ක රැඳවුම් මුදල නිදහස් කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** කලේගාන, වක්වැල්ල ප්‍රධාන මාර්ගයේ කි.මී. 05 කණුව ආසන්නයේ වමට හැරෙන පැගිරිවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** හපුගල, ජනඋදාන ගම්මාන මාර්ග පිවිසුම ආසන්නේ ඇති අනතුරුදායක බෝ ගස සහා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම බෝ ගස අනතුරුදායක බැවින් එය කපා ඉවත් කරන ලෙස දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, බෝ ගස අසල ඇති නිවෙස් වලට අනතුරුදායක තත්ත්වයක් ඇති බවට ගම්වැසියන් විසින් ලියුමක් සකස් කොට තමා වෙත ලබා දුන් බැවින් මෙම බෝ ගස කපා ඉවත් කිරීම සඳහා යෝජනා කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමාගේ යෝජනා</u>**

ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා මේ වන විට සභා ගර්භයේ නොමැති බැවින් හා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමක් සිදු කර නොමැති බැවින්, මෙම යෝජනාව ඊළඟ මහා සභා රැස්වීම දක්වා කල් තබන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා අසනීප තත්ත්වයෙන් පෙළීම නිසා අද දින මහා සභා රැස්වීමට සහභාගි විය නොහැකි බැවින්, ගරු උප සභාපතිතුමා හට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**18.** ගිංතොට තුනී ලෑලි සංස්ථා භූමිය අප ප්‍රාදේශීය සභාවට පවරාගෙන එම භූමියේ පාරිසරික සංචාරක නිවාඩු නිකේතනයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**19.** ගල්කැටියවත්ත ග්‍රාම නිලධාරි වසමේ රණවිරු ප්‍රියංකර මාවත, ගොන්නගහවත්ත, සල්ගහ පාර ආරම්භක හන්දියේ ජලය බැස යාමට හියුම් පයිප්ප යෙදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**20.** රණවිරු ප්‍රියංකර මාවත දෙපස කාණු පද්ධතිය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා කැපීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**21.** රණවිරු ප්‍රියංකර මාවතේ කේ.වී. ආරියපාල මයා විසින් සහ බී.ජී. කල්‍යානි මිය විසින් අවහිර කර ඇති පිටවාන ජේ.සී.බී යන්ත්‍රය යොදා සැකසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**22.** රණවිරු ප්‍රියංකර මාවතේ කේ.වී. ආරියපාල මයා විසින් සහ බී.ජී. කල්‍යානි මිය විසින් සිදුකර ඇති අනවසර ඉදිකිරීම් පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**23.** රණවිරු ප්‍රියංකර මාවතේ කේ.වී. ආරියපාල මයා විසින් සහ බී.ජී. කල්‍යානි මිය විසින් පිටවානක් අවහිර කරමින් සිදුකළ කුඹුරු ඉඩමක් ගොඩකිරීම පිළිබඳව නීතිය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලෙසට ජනාධිපති විමර්ශන අංශයට දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කාරණයේ යම් සත්‍යතාවයක් ඇති බවත්, ඒ පාර්ශව සියල්ලම පාර දෙපස කාණු පද්ධතිය අවශ්‍ය පරිදි සකස් කිරීමට එකඟතාවය පළ කොට ඇති බවත්, මල්වැටවල් වලින් සහ වැහිපීලි වලින් ජලය පාරට ගලා ඒමට සැලැස්වීම නිසා මාර්ගයට අලාභ හානි සිදු වී ඇති බැවින්, එම වැරදි නිවැරදි කිරීමට හා ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගෙන අවහිර වී ඇති කාණු පද්ධතිය නිවැරදි කරන ලෙසත් තාක්ෂණ නිලධාරිතුමියට තමා විසින් උපදෙස් ලබා දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ගැටළුව අවුරුදු තුනකට ආසන්න කාලයක් තිස්සේ ඇති බවත්, පාරට අවහිර වන සේ බැම්මක් ඉදිකිරීම නිසා වතුර රඳා පැවතීම හේතුවෙන් මෙම ගැටළුව නිර්මාණය වූ බවත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් මාර්ගය දෙපස කාණු පද්ධතිය සති දෙකක් ඇතුළත නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**24.** කරාපිටිය, පැල්පොලවත්ත කඩොලාන පරිසර පද්ධතිය කුලී පදනම මත ලබා ගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීමටත්, එම භූමිය ජලජ ජීවීන් සුරකින පෝෂිත ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**25.** මාකන්වත්ත, පළමු අතුරු මාර්ගයේ කාණු පද්ධතියේ ජලය බැස යාම සඳහා හියුම් පයිප්ප යෙදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**26.** ගොඩකන්ද, අඹගහවත්ත මාර්ගයේ ජල ගැටළුව විසඳීම සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා කාණුවක් සැකසීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**27.** කරාපිටිය, වැලිකැටියවත්ත මාර්ගයේ වංගුව අසළට හියුම් පයිප්ප යෙදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>**

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා මේ වන විට සභා ගර්භයේ නොමැති බැවින් හා මෙම යෝජනාවන් සභාවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමක් සිදු කර නොමැති බැවින්, මෙම යෝජනාවන් ඊළඟ මහා සභා රැස්වීම දක්වා කල් තබන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**32.** කිතුලම්පිටිය - යද්දෙහිවත්ත මාර්ගයේ ආරියරත්න මහතාගේ නිවස අසළ, මාර්ගයට මායිම් වන ගල් බැම්ම කැඩීගොස් ඇති නිසා එය මාර්ගයේ ගමන් කරන ජනතාවට අනතුරුදායක ලෙස බලපාන බැවින් එම බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**33.** පුවක්වත්ත, තාහිම් මොහොමඩ් මයාගේ නිවස ඉදිරිපිට මාර්ගය සභාව මගින් මැනුම් කටයුතු සිදුකොට කොන්ක්‍රීට් යොදා කාණු පද්ධතිය සහ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**34.** බෝපෙ, ශ්‍රී ප්‍රියරතන මාවතේ පදිංචි ප්‍රියන්ත ගල්ගොඩැල්ල මහතාගේ ඉඩමේ තාප්පය ඉදිකිරීම සම්බන්ධව ඇති ගැටළුව නිරාකරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ ඉදිකිරීමේ ගැටළුකාරි ස්ථානය අඟල් හයක් පසුපසට ගෙන ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා එකඟතාවය පළ කොට ලිඛිත ඉල්ලීමක් සභාව වෙත ලබා දීමට කටයුතු කරන බව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

සැලසුම් කමිටුව විසින් ගන්නා ලද තීන්දුව හැල්ලුවට ලක් වීමක් සිදු වූ බවත්, එම ඉදිකිරීමේ ගැටළුකාරි ස්ථානය ඉඩම තුළට ගැනීම සිදු කිරීමෙන් පසු ඒ සඳහා අනුමැතිය ලබා දිය හැකි බවත්, එම කාර්යය සභාවේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු බවටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**35.** ඇළබඩ පාලම අසළ ඇති සන්බීම් පාර්ක් මාර්ගයට හියුම් පයිප්ප දෙකක් යෙදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>**

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා මේ වන විට සභා ගර්භයේ නොමැති බැවින් හා මෙම යෝජනාවන් සභාවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමක් සිදු කර නොමැති බැවින්, මෙම යෝජනාවන් ඊළඟ මහා සභා රැස්වීම දක්වා කල් තබන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

**<u>ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>**

**39.** නාවින්න ප්‍රධාන මාර්ගයේ සහ අතුරු මාර්ගයේ ඇති කාණු පද්ධතිය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**40.** ජයබිම හාඩ්වෙයාර් එක අසළ ඇති කුරුඳුවත්තට යාබද පාරේ කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>**

ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා මේ වන විට සභා ගර්භයේ නොමැති බැවින් හා මෙම යෝජනාවන් සභාවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමක් සිදු කර නොමැති බැවින්, මෙම යෝජනාවන් ඊළඟ මහා සභා රැස්වීම දක්වා කල් තබන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u> ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2021-09-17 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2021-10-13 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2021-09-17 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

II. 2021-10-13 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව :- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව :- නැත**

**(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2021 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2021 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2021 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ- නැත**

**(ඍ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අනුමත වී ඇති බවටත්, එහි දිග අඩි 177 ක් වන බැවින් පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට සිදු වන බවටත්, නව සභා ගොඩනැගිල්ලේ පළල එක් පසෙකින් අඩි 63 ක් සහ අනෙක් පසින් අඩි 38 ක් වන බවටත්, සභා රැස්වීම් ශාලාව පාර්ලිමේන්තුවේ ආකෘතිය අනුව සකස් කරන බවටත්, නව සභා ගොඩනැගිල්ලේ වෙනම රැස්වීම් ශාලාවක්, සභාපති, උප සභාපති හා ලේකම් සඳහා නිල කාමර, මන්ත්‍රීවරුන්ට වෙනම රැස්වීම් ශාලාවක් අන්තර්ගත බවටත්, රමේෂ් පතිරණ ගරු ඇමතිතුමා මෙම කාර්යය සඳහා මූලිකත්වය අරගෙන කටයුතු කරන බවටත්, මෙම සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ටෙන්ඩර් කටයුතු පළාත් පාලන අමාත්‍යාංශය හරහා සිදු කරන බවටත්, මෙම වර්ෂය අවසාන වීමට පෙර මෙම සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිත බවටත්, කලේගාන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුකර ගෙන යන බවටත්, ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා විසින් රුපියල් ලක්ෂ පනහක ප්‍රතිපාදනයක් ඒ සඳහා ප්‍රදානයක් ලෙස ලබාදුන් බවටත්, වර්ග අඩි නමදාහක් වන පහළ මහළ ටෙන්ඩර් කිරීම සඳහා පත්තර දැන්වීමක් පළ කිරීමට යෝජිත බවටත්, පහළ මහළ කොටස් වශයෙන් බෙදා වෙන් කර හෝ සම්පූර්ණ වශයෙන් හෝ ටෙන්ඩර් කොට එමගින් එක්වන් මුදලක් ලබා ගෙන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ ඉතිරි කොටස්වල වැඩ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන

බවටත්, ආදාහනාගාර ඉදිකිරීමේ කටයුතු සඳහා ලබන මාසයේදී මුල්ගල තබා වැඩ ආරම්භ කිරීමට නියමිත බවටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් රජයේ ගොඩනැගිලි ඉදිකිරීමේදී යොදා ගන්නේ රටේ මහජනතාවගේ බදු මුදල් වන බැවින් ඉතා හොඳ තත්ත්වයේ පවතින පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම අපරාධයක් වන බැවින් නව සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මේ සඳහා යම්කිසි ක්‍රමවේදයක් සැලසුම් ශිල්පියා සමඟ සාකච්ඡා කොට පුස්තකාල ගොඩනැගිල්ලටම සම්බන්ධ කරමින් නව දෙමහල් සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේ හැකියාව සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

පුස්තකාල ගොඩනැගිල්ල සමඟ නව සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේදී එහි ආකෘතියට යම් බලපෑමක් ඇති වන බැවින්, සංවර්ධන කටයුත්තේ අවශ්‍යතාවය සළකා පුස්තකාල ගොඩනැගිල්ල නොසලකා හැර අදාළ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් තමා දැනුවත් කළ බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගාල්ල - වක්වැල්ල ප්‍රධාන මාර්ගයේ සිට සේවක විවේකාගාරය දක්වා මෙම සභා ගොඩනැගිල්ල ඉදිකළ හැකි බවටත්, මෙම පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කළහොත් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධව ඇති ජනතා ප්‍රසාදය පවා නැති වී යා හැකි බවටත්, ඒ සම්බන්ධව වගකීම අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්ටත් පැවරෙන බැවින් මෙම පුස්තකාල ගොඩනැගිල්ල ආරක්ෂා වන පරිදි නව සභා ගොඩනැගිල්ල ඉදි කළ යුතු බවටත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් පසුගිය කාලය තුළ කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම, වැසිකාලය එළඹීම සහ වෙනත් හේතූන් මත වීදි පහන් නඩත්තු කිරීමේ කටයුතු ක්‍රමවත්ව සිදු කිරීමට නොහැකි වූ බවටත්, විදුලි කාර්මිකයන් දෙදෙනෙකු හා විදුලි අංශය සඳහා වෙනම නිලධාරියෙකු පත් කළද, බලාපොරොත්තු වූ ආකාරයෙන් වීදි පහන් නඩත්තු කිරීමේ කටයුතු සිදු කර ගැනීමට නොහැකි වූ බවටත්, දෛනිකව සිදු කරන වීදි පහන් නඩත්තු කිරීමේ කටයුතුවල අක්‍රමවත්භාවය මීට හේතු වී ඇති බැවින් වීදි පහන් නඩත්තු කිරීමේ කටයුතු සඳහා කොට්ඨාශ මට්ටමින් විධිමත් ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

වීථි පහන් නඩත්තු කිරීමේ කටයුතුවලදී ඇති වන අඩුපාඩු අවම කිරීම සඳහා එක් දිනකදී කොට්ඨාශ තුනකට විදුලි වාහනය ඉදිරියේදී යොදවන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව බඳවා ගත් විශ්‍රාමික රියදුරන් දෙදෙනාගේ සේවය අවසන් කිරීමට හේතු වූ කරුණු පිළිබඳව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

බහුකාර්ය දෙපාර්තමේන්තුව හරහා රියදුරු මහත්වරුන් තිදෙනෙකු අප ප්‍රාදේශීය සභාව වෙත යොමු කර ඇති බවටත්, එම රියදුරන් තිදෙනා හට සභා අරමුදලින් වැටුප් ගෙවීමක් සිදු නොකරන බවටත්, එම රියදුරන් තිදෙනා අපේ ප්‍රාදේශීය සභාවට ලබා දීම හේතුවෙන් සභා අරමුදලින් ගෙවීම් කිරීමේ පදනම මත බඳවා ගත් විශ්‍රාමික රියදුරු දෙපළගේ සේවය ලබා ගැනීම අවසන් කළ බවටත්, නැවත මෙම රියදුරන් තිදෙනා බහුකාර්ය දෙපාර්තමේන්තුවට කැඳවූ පසු විශ්‍රාමික රියදුරන් දෙදෙනාගේ සේවය සභාවට ලබා ගත හැකි බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවය මත අදාළ විශ්‍රාමික රියදුරන් දෙදෙනා සේවයෙන් ඉවත් කළ බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශයක් කළාද යනුවෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් එසේ ප්‍රකාශයක් සිදු නොකළ බවට සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් නරාවල කොට්ඨාශයේ ඇති වෙන්දේසි ඉඩම්වල පදිංචි නිවැසියන්ගේ කසළ එක්රැස් කිරීමේ ගැටළු ඇති බැවින් ඒ සඳහා ටැක්ටර් රථයක් යොදවන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ඒ සඳහා ට්‍රැක්ටර් රථයක් ඉදිරියේදී යොදවන බවටත්, කාසල් හිල් වත්තේ පාරක් කැපීමේදී නිවැසියන් පිරිසක් අපහසුතාවයට පත්ව ඇති බවටත්, එම නිවසේ පදිංචිකරුවන් අනාරක්ෂිත තත්ත්වයකට පත්ව ඇති

බැවින් ඒ සඳහා යම් සාධාරණයක් ඉෂ්ට කළ යුතු බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අදාළ සිදුවීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කොට එම නිවැසියන් සඳහා සාධාරණයක් ඉෂ්ට කරන ලෙස ඉල්ලා සිටින ලද ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් පුස්තකාල ගොඩනැගිල්ල හා සේවක විවේකාගාරය යන ගොඩනැගිලි දෙක ඉතුරු කරගෙන ඉදිකිරීමට යෝජිත නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකරන ලෙසට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් නොකර නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් යෝජිත කාර්යාල ගොඩනැගිල්ලේ ආකෘතියට ඇති වන බලපෑම පිළිබඳව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් මාර්ගයන් දෙපස කැලි කසළ දැමීමෙන් වළකින ලෙස දැන්වීම් පුවරු සවි කරන ලෙසත්, මාර්ගයන් දෙපස දැනට එක්රැස් වී ඇති කසළ ට්‍රැක්ටර් රථයක් යොදවා එකතු කොට ඉවත් කරන ලෙසට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ඉන්දියාවේ නිෂ්පාදිත යන්ත්‍රයක් භාවිතා කොට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා සෙනොක් ආයතනය විසින් තමා වෙත ව්‍යාපෘතියක් යෝජනා කළ බවටත්, එම යන්ත්‍රයේ වටිනාකම රුපියල් ලක්ෂ දෙසිය පනහක් පමණ වන බවටත්, පර්චස් හතලිහක පමණ ඉඩ ඇති ඉඩමක මෙම යන්ත්‍රය භාවිතයෙන් දෛනිකව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කළ හැකි බවට සෙනොක් ආයතනය විසින් තමා දැනුවත් කළ බවටත්, ගාල්ල මහා නගර සභාවේ කවෂිමා යන්ත්‍ර ව්‍යාපෘතිය සඳහා කසළ ලබා දීමට එකඟතාවය පළ කොට ඇති බැවින් ඉදිරියේදී මේ සම්බන්ධව තීරණයක් ගැනීමට බලාපොරොත්තු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් වීදි පහන් නඩත්තු කටයුතු සඳහා දිනකට කොට්ඨාශ දෙකක් වෙත විදුලි වාහනය යොදවන ලෙසත්, වීදි පහන් නඩත්තු පැමිණිලි පිළිබඳව සභාවේ දුරකථනයට දැනුම් දෙන ලෙසට මහජනතාව දැනුවත් කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් නරාවල කොට්ඨාශයේ කණ්ඩියක් කැපීමේදී ගැටළුවක් ඇති වූ ස්ථානය ආසන්නයේ ඇති මාර්ගය රමේෂ් පතිරණ ගරු ඇමතිතුමාගේ ප්‍රතිපාදන මත කාපට් කිරීමට පෙර මාර්ගයේ නියමිත පළලට පුළුල් කිරීමේ කටයුතු සිදු නොකර මාර්ගය කාපට් කිරීමේ කටයුතු සිදු කිරීම සම්බන්ධව ප්‍රදේශවාසීන් විසින් විරෝධතාවය පළ කළ බවටත්, ස්ථාන කිහිපයක මාර්ගයේ නියමිත පළල වූ අඩි 20 ක ප්‍රමාණය නොතිබූ බැවින් මාර්ගයේ මැනුම් කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීමට මුලින්ම යෝජනා කළ බවටත්, අදාළ මාර්ගය මැනුම් කටයුතු සිදු කිරීමේදී ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතයා ලෙස ප්‍රදේශයභාර ග්‍රාම නිලධාරිවරයා කටයුතු කළ බවටත්, මාර්ගයේ මැනුම් කටයුතු සිදු කර මාස තුනක් ගත වූ පසු සභා යෝජනාවක් යොදා මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීමට කටයුතු කළ බවටත්, එහිදී නරාවල කොට්ඨාශය භාර තාක්ෂණ නිලධාරිතුමිය, ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරිතුමා හා පොලීසියේ මැදිහත්වීමෙන් අදාළ මාර්ගය පළල් කිරීමේ කටයුතු සිදු කළ බවටත්, තමා පදිංචි ඉඩමෙන්ද මාර්ගය පළල් කිරීමේ කටයුතු සඳහා ඉඩ ලබා දුන් බවටත්, මාර්ගය පළල් කිරීම හේතුවෙන් කිසිදු පුද්ගලයෙකු වෙත අසාධාරණයක් සිදු වී නැති බවටත්, අදාළ ස්ථානය සඳහා බැම්මක් ඉදිකිරීම සම්බන්ධව තමාගේ විරෝධතාවයක් නොමැති නමුත් මාර්ගයේ නියමිත පළලට පුළුල් කිරීමෙන් පසු අදාළ බැම්ම ඉදිකිරීමේ කටයුතු සිදු කළ යුතු බවටත් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ගිවිසුම් අත්සන් කළ ද මාම්පිටිය කොට්ඨාශයේ අඹගහවත්ත මාර්ගය කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා සංවර්ධනය කර ගැනීමට නොහැකි වූ බවට ප්‍රකාශ කරන ලදී.

එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇති ගිවිසුම අවලංගු කොට නව ඇස්තමේන්තුවක් සකස් කර අදාළ ඉදිරි කටයුතු සිදු කරන ලෙසත්, අදාළ මාර්ගය සංවර්ධනය කිරීමේදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා ප්‍රදේශවාසීන්ගේ සහයෝගය ලබා ගත යුතු බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් කලේගාන පොළ භූමියේ වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමේ උත්සවයේදී කලේගාන කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා ලෙස තමා වෙත දැක්වූ නොසැලකිල්ල නිසා සිත් තැවුලට පත් වූ බවට ප්‍රකාශ කරන ලදී.

එය වැරදි වැටහීමක් බවත් කලේගාන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා මුල්ගල් තැබීමේ උත්සවය සංවිධානය කළ ආකාරය පිළිබඳව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u>**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-11-17 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.